# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
## OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01


මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-PAY/08/FI/14-2022
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2022.08. 01

පළාත් අධ්‍යක්ෂ,

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,

බස්නාහිර පළාත.

**<u>දේශීය පුහුණු සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම - 2022 ඇස්තමේන්තුව</u>**

පහත සඳහන් සැපයීම්/සේවාවන් වෙනුවෙන් වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන ඔබ වෙත වෙන් කර දෙනු ලැබේ.

| වැය සම්මතය | විස්තරය | වෙන් කරන ප්‍රතිපාදන මුදල |
|---|---|---|
| 109-03-01-2401/12(i) | බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අනුයුක්තව පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයේ සේවයේ නියුතු පශුවෛද්‍ය නිලධාරි කේ.එල්.එන්. ජයසිංහ මිය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන Master of Animal Reproduction පාඨමාලාව හැදෑරීමට පළමු වාරිකය සඳහා ප්‍රතිපාදන ලබාදීම | රු. 20,000.00 |

02. සියළුම ගෙවීම් වවුචර්වල ඉහත සඳහන් වැය විස්තර නිවැරදිව සටහන් කිරීමට දැඩි ලෙස සැලකිල්ලට යොමු විය යුතු බව පෙන්වා දෙමි.

03. මෙම මුදල් වෙන් කර දීම වියදම් දැරීම සඳහා ප්‍රමාණවත් බලයක් ලෙස සැලකිය යුතු නොවේ. සියලුම වියදම් දැරිය යුත්තේ අදාළ පළාත් සභා මූල්‍ය රීති, ආයතන සංග්‍රහයේ විධි විධාන, ප්‍රසම්පාදන වැඩසටහනේ සඳහන් විධි විධාන සහ රජය සහ පළාත් සභාව විසින් කලින් කලට නිකුත් කරනු ලබන උපදෙස්වලට අනුකූලවයි. මෙහිදී පළාත් මූල්‍ය රීති 93,94,138,324 හා 325යේ විධි විධාන කෙරෙහි මෙහිලා විශේෂ අවධානය යොමු කරවන අතර එකී විධි විධාන දැඩි ලෙස පිළිපැදිය යුතු ය.

04. මෙම මුදල් වෙන් කිරීම එය ප්‍රදානය කළ නිශ්චිත කාර්යයන් වෙනුවෙන් හැර වෙනත් කාර්යයන් සඳහා උපයෝගී කර නොගත යුතු ය. එය වෙනත් දෙපාර්තමේන්තුවකට පැවරීමට ද නොහැක.

05. කිසිම හේතුවක් නිසාවත් මෙම ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා වියදම් නොකළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මෙම ප්‍රතිපාදන ඊට කළින් ආපසු පවරා නොගත හොත් දෙසැම්බර් 31 දිනෙන් අහෝසි වන්නේ ය .

06. මෙම මුදල වෙන් කිරීමෙන් දරණ ලද නියම වියදම ගෙවීම් කළ මාසයේම ඔබගේ ගිණුම් සාරාංශය මගින් ප්‍රධාන ලේකම්ට වාර්තා කළ යුතු අතර එයට අමතරව පහත දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව හර නිවේදනයක් මගින් මාසය අවසානයේ පහත සඳහන් විද්‍යුත් ලිපිනයට මා වෙත වාර්තා කළ යුතු ය. එසේ හර නිවේදනයක් එවීම වෙන් කළ මුදලින් දරන්නා වූ ගෙවීම් සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරනු ලබන ගිණුම් වාර්තාවලට වැඩිමනක් වශයෙන් බව කාරුණිකව දන්වමි.

විද්‍යුත් ලිපිනය : csfpayment@wpc.gov.lk

එස්.ඊ.එච්. චතුරිකා මුණිදාස
ගණකාධිකාරී (ගෙවීම්),
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

පිටපත් :-

01) ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප).
02) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
03) ගණකාධිකාරී (පොත් තැබීම්)

එස්. ඊ. එච්. චතුරිකා මුණිදාස
ගණකාධිකාරී (ගෙවීම්)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත

ප්‍රධාන ලේකම් (බ.ප.),

**.......................................... මස හර නිවේදනය.**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලය :- ..........................................................

| | වැය සම්මතය | ලබා ගෙන ඇති ප්‍රතිපාදන මුදල රු. | මාසය තුළ වියදම රු. | මාසය අවසානයට මුළු වියදම රු. | ඉතිරි ප්‍රතිපාදන මුදල රු. |
|---|---|---|---|---|---|
| 01. | ..................... | ..................... | ..................... | ..................... | ..................... |
| 02. | ..................... | ..................... | ..................... | ..................... | ..................... |
| 03. | ..................... | ..................... | ..................... | ..................... | ..................... |

දිනය :- ..........................

......................
ආයතන ප්‍රධානී